# 2023 අවුරුදු නැකත් චාරිත්‍ර - ඕස්ට්‍රේලියාව

**අවුරුදු උදාව**

2023 අප්‍රේල් මස 14 වන සිකුරාදා ශ්‍රී ලංකා වේලාවෙන් අපර භාග 02:59 ට ද, සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්,බ්‍රිස්බේන් සහ හෝබාර්ට් නගර වල වේලාවෙන් අපර භාග 7:29 ට ද, ඇඩිලේඩ් සහ ඩාර්වින් නගර වල වේලාවෙන් අපර භාග 06:59 ට ද, පර්ත් නගරයේ වේලාවෙන් අපර භාග 05:29 ට ද, අලුත් අවුරුද්ද උදා වෙයි.

**පුණ්‍ය කාලය (නොනගතය)**

ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන නගර වලට පුණ්‍ය කාලය සම්මත ඔරලෝසු කාලයෙන් පහත සඳහන් පරිදි වේ.

සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හෝබාර්ට් නගර වලට අප්‍රේල් මස 14 වන සිකුරාදා අපර භාග 01:05 සිට පසුදින පූර්ව භාග 01:53 දක්වා ද, ඇඩිලේඩ් සහ ඩාර්වින් නගර වලට 14 වන සිකුරාදා අපර භාග 12:35 සිට ට පසුදින පූර්ව භාග 01:23 දක්වා ද, පර්ත් නගරයට 14 වන සිකුරාදා පූර්ව භාග 11:05 සිට එදින අපර භාග 11:53 දක්වා ද, පුණ්‍ය කාලය බැවින් එම කාලය ආරම්භ වීමට පෙර සියළු වැඩ අතහැර, පුණ්‍ය කාලයේ පෙර භාගය තුල ආගමික වතාවත් වල යෙදීමත් පුණ්‍ය කාලයේ අපර භාගය තුල පහත දැක්වෙන අයුරින් ආහාර පිසීම, වැඩ අල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදි චාරිත්‍ර ඉටු කිරීමත් යෝග්‍ය වේ.

**ආහාර පිසීම**

අප්‍රේල් මස 14 වන සිකුරාදා විවිධ වර්ණ සහිත වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වෙලාවන්ට ලිප ගිනි මොළවා දී කිරි මිශ්‍ර කිරිබතක් ද තල සහ විළඳ මිශ්‍ර කැවිලි වර්ගයක් ද පිළියෙල කර ගැනීම මැනවි.

| | | | | | |
|---|---|---|---|---|---|
| සිඩ්නි | අපර භාග 07:45 | බ්‍රිස්බේන් | අපර භාග 07:41 | ඩාර්වින් | අපර භාග 08:47 |
| කැන්බරා | අපර භාග 07:52 | හෝබාර්ට් | අපර භාග 07:54 | පර්ත් | පූර්ව භාග 07:43 |
| මෙල්බර්න් | අපර භාග 08:07 | ඇඩිලේඩ් | අපර භාග 08:05 | | |

**වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය**

අප්‍රේල් මස 14 ව සිකුරාදා විවිධ වර්ණ සහිත වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වෙලාවන්ට සියලු වැඩ අල්ලා ගණුදෙනු කොට ආහාර අනුභවය මැනවි.

| | | | | | |
|---|---|---|---|---|---|
| සිඩ්නි | අපර භාග 08:54 | බ්‍රිස්බේන් | අපර භාග 08:49 | ඩාර්වින් | අපර භාග 09:53 |
| කැන්බරා | අපර භාග 09:02 | හෝබාර්ට් | අපර භාග 09:05 | පර්ත් | අපර භාග 09:11 |
| මෙල්බර්න් | අපර භාග 09:17 | ඇඩිලේඩ් | අපර භාග 09:15 | | |

**හිස තෙල් ගෑම**

අප්‍රේල් මස 16 වෙනි ඉරිදා රතු සහ කහ මිශ්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන්ට හිසට ඉඹුල් පත් ද, පයට නුග පත් ද තබා තෙල් සහ ඉඹුල් පත් යුෂ මිශ්‍ර නානු ද ගා ස්නානය කිරීම මැනවි.

| | | | | | |
|---|---|---|---|---|---|
| සිඩ්නි | පූර්ව භාග 09:44 | බ්‍රිස්බේන් | පූර්ව භාග 09:35 | ඩාර්වින් | පූර්ව භාග 10:29 |
| කැන්බරා | පූර්ව භාග 09:46 | හෝබාර්ට් | පූර්ව භාග 10:04 | පර්ත් | පූර්ව භාග 10:06 |
| මෙල්බර්න් | පූර්ව භාග 10:11 | ඇඩිලේඩ් | පූර්ව භාග 10:05 | | |

**ඔබ සැමට සුබ අලුත් අවුරුද්දක් වේවා !**

සැකසුම: මහින්ද කරුණාරත්න, සිඩ්නි, ඕස්ට්‍රේලියාව. Email:mahindawk@gmail.com